දුම්රිය
புகையிரத
Railway — GMF 35

ඔබේ අංකය
உமது இல
Your No. —

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone —

*E- mail*: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office — 2 4 2 1 2 8 1

ෆැක්ස්
தொலைநகல்
Fax — 2 4 4 6 4 9 0

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS

මගේ අංකය
எனது இல
My No. — GMR/Media/28/07/2026

සාමාන්‍යාධිකාරි
තැ.පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.

දිනය
தேதி
Date — 2026/07/28

**<u>කැලණිවැලි මාර්ගයේ නාරාහේන්පිට සහ නුගේගොඩ දුම්රිය ස්ථාන අතර පිහිටි "නාවල-නාරාහේන්පිට පාර" දුම්රිය හරස් මාර්ගයේ සිදු කරනු ලබන අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුත්තක් හේතුවෙන් දුම්රිය ධාවනය සීමා කිරීම සහ එම දුම්රිය හරස් මාර්ගය වසා තැබීම.</u>**

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කැලණිවැලි මාර්ගයේ නාරාහේන්පිට සහ නුගේගොඩ දුම්රිය ස්ථාන අතර සැතපුම් 03 දම්වැල් 64 ස්ථානයේ පිහිටි නාවල-නාරාහේන්පිට පාර දුම්රිය හරස් මාර්ගයේ අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුත්තක් හේතුවෙන් **<u>2026/08/01 (සෙනසුරාදා) දින ප.ව. 07.00 සිට 2026/08/02 (ඉරිදා) දින ප.ව. 08.00 දක්වා දුම්රිය ධාවනය පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර එම කාල සීමාව තුල "නාවල-නාරාහේන්පිට පාර" දුම්රිය හරස් මාර්ගය වාහන ගමනාගමනය සඳහා සම්පූර්ණයෙන් වසා තැබේ.</u>** ඒ අනුව,

- 2026/08/01 (සෙනසුරාදා) දින ප.ව. 07.00 සිට 2026/08/02 (ඉරිදා) දින ප.ව. 08.00 දක්වා, කැලණිවැලි මාර්ගයේ කොළඹ කොටුව සහ නුගේගොඩ දුම්රිය ස්ථාන අතර දුම්රිය ධාවනය සිදු නොවේ.

- 2026/08/01(සෙනසුරාදා) පස්වරුවේ කැලණිවැලි මාර්ගයේ දුම්රිය ධාවනය පහත පරිදි සැලසුම් කර ඇත.

| දුම්රිය අංකය | පිටත්වන වේලාව | සිට | දක්වා |
|---|---|---|---|
| 9262 | ප.ව. 04.25 | කොළඹ කොටුව | අවිස්සාවේල්ල |
| 9264 | ප.ව. 05.45 | කොළඹ කොටුව | අවිස්සාවේල්ල |
| 9269 | ප.ව. 06.30 | කොළඹ කොටුව | කොස්ගම |
| 9271 | ප.ව. 08.45 | නුගේගොඩ | අවිස්සාවේල්ල |

- 2026/08/02(ඉරිදා) උදැසන අවිස්සාවේල්ල දුම්රිය ස්ථානයෙන් දුම්රියන් තුනක් නුගේගොඩ දුම්රිය ස්ථානය දක්වා පමණක් ධාවනය කරන අතර එම දුම්රිය තුන සවස අවිස්සාවේල්ල දක්වා පහත පරිදි ධාවනය කිරීමට සැලසුම් කර ඇත.

| දුම්රිය අංකය | අවිස්සාවේල්ල - පිටත්වන වේලාව |
|---|---|
| 9649 | පෙ.ව.05.00 |
| 9641 | පෙ.ව.05.55 |
| 9651 | පෙ.ව.06.25 |

| දුම්රිය අංකය | නුගේගොඩ - පිටත්වන වේලාව |
|---|---|
| 9262 | ප.ව.05.30 |
| 9264 | ප.ව.06.45 |
| 9271 | ප.ව.08.30 |

අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුත්ත හේතුවෙන් මගී ජනතාවට හා හරස් මාර්ගය භාවිත කරන්නන්ට සිදුවන අපහසුතාව පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන අතර ඉහත කාල සීමාව තුල "නාවල-නාරාහේන්පිට පාර" හරස් මාර්ගය වෙනුවට විකල්ප මාර්ග භාවිත කරන ලෙස ඉල්ලා සිටිමි.
මේ සම්බන්ධව ජනමාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

G.D.A සමරසිංහ
අධිකාරි (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට